ජාතික තරඟකාරි ලංසු කැඳවීමේ පටිපාටිය

යටතේ

# කොණ්ඩච්චි වතු යාය වටා කිලෝමීටර් 26 ක් දිගු (අලි) විදුලි වැටක් ඉදිකිරීම .

**ප්‍රසම්පාදන අංකය : SLCC/ADM/PRO/84/2024 - (2025-30)**

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා කජු සංස්ථාව,**

තෙලවල පාර ,

රත්මලාන.

# I වන කොටස

# ලංසුකරුවන්ට උපදෙස් (අයි. ටී. බී.)

| | | |
|---|---|---|
| **1.** | **(අ) පොදු කරුණු** | |
| **1.1** | ලංසු තැබීම | මෙහි II කොටසේ දත්ත පත්‍රිකාවේ පෙන්වා දී ඇති මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිලාවතුර ග්‍රාමසේවා වසමේ පිහිටි ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් **කොණ්ඩච්චි වතුයාය වටා කිලෝමීටර් 26 ක් දිගු** විදුලි වැටක් ඉදිකිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන් මඟින් මුද්‍රා තබන ලද මිල ලංසු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. |
| **2.** | **(ආ) අන්තර්ගත ලේඛන** | |
| **2.1** | අන්තර්ගත ලේඛන | **පහත දැක්වෙන ලේඛන අයත් වේ.**<br>**I.** වන කොටස : ලංසු කරුවන්ට උපදෙස්<br>**II.** වන කොටස : දත්ත පත්‍රිකාව<br>**III.** වන කොටස : අවශ්‍යතා උපලේඛනය I හා II<br>**IV.** වන කොටස : තාක්ෂණික පිරිවිතර හ පිරිවිතරවල අනුකූලතාව<br>**V.** වන කොටස : මිල උපලේඛනය (ලංසු සුරක්ෂණ )<br>**VI.** වන කොටස : මිල උපලේඛනය (ලංසු ලේඛන සඳහා )<br>**VII.** වන කොටස : කාර්ය සාධන සුරක්ෂණය සඳහා ආකෘති පත්‍රය<br>**VIII.** වන කොටස : මිල ලංසු ඉදිරිපත් කිරිමේ ආකෘති පත්‍රය<br>**IX.** වන කොටස : ගිවිසුම් පත්‍රයේ ආකෘතිය |
| **3.** | **(ඇ). මිල ලංසු සැකසීම** | |
| **3.1** | මිල ලංසු වලට ඇතුළත් වන ලේඛන | මිල ලංසු වලට පහත දැක්වෙන ලේඛන ඇතුළත් විය යුතු වේ.<br>(අ) . මිල ලංසු ඉදිරිපත් කිරිමේ ආකෘති පත්‍රය හා මිල යෝජනා<br>(ආ). අවශ්‍යතා උපලේඛනය (II,III,IV,V,VI,VII,IX)<br>(ඇ). මිල උපලේඛනය<br>(ඈ). ලංසු සුරක්ෂණය<br>(ඉ). රජයේ කොන්ත්‍රාත් සිදුකිරීම සඳහා පිළිගත් සහතික පත්‍රයක් (ICTAD/CIDA) උදා :- ICTAD ශ්‍රේණිගත කිරීමේ C7 හෝ ඉහළ ශ්‍රේණියක විය යුතුය.<br>(ඊ) මුදල් ගෙවූ රිසිට් පත ( ආපසු නොගෙවන හා ආපසු ගෙවන මුදල් සඳහා ) |
| **3.2** | මිල ලංසු ඉදිරිපත් කිරිමේ ආකෘතිය හා මිල ලංසු ලේඛනය | **ඉහත අංක 2 හි 2.1 යටතේ VIII වන කොටසේ දැක්වෙන ආකෘති පත්‍රය යොදා ගෙන ලංසුකරුවන් විසින් මිල ලංසු ඉදිරිපත් කළ යුතු වේ.** ආකෘති පත්‍රයේ ස්වරූපය විකෘති වන ආකාරයේ වෙනස්කම් නොකළ යුතු වේ. විකල්ප ආකෘති පිළිගනු නොලැබේ. **ලංසු ඉදිරිපත් කිරීම සඳහා කජු සංස්ථාව විසින් සපයනු ලබන ලංසු ලේඛන පමණක් භාවිතා කල යුතුය.** ආකෘති පත්‍රයේ හිස්තැන් නොතිබෙනසේ ඉල්ලා ඇති විස්තර සම්පූරණ කළ යුතුවේ. |
| **3.3** | | **කොන්ත්‍රාත් ආයතනය අසාදු ලේඛන ගත වී නොතිබිය යුතුය.** |

| | | |
|---|---|---|
| | | **විකල්ප මිල යෝජනා සලකා බලනු නොලැබේ.** මේ අනුව එකම අයිතමයක් සඳහා විකල්ප මිල යෝජනා ඉදිරිපත් නොකරන ලෙස කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.ඔබ සතු උපරිම තරගකාරී මිල ගණන් ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිනු ලැබේ. |
| | | **දත්ත පත්‍රිකාවේ විශේෂ කොට දක්වා නැති අවස්ථාවල හැරෙන්නට අනික් සියළුම මිල යෝජනා ලංසු ලේඛනවල ඒ ඒ අයිතමයට වෙන් වෙන් වශයෙන් සඳහන් කල දිය යුතුවේ.** |
| | | **තමන් සතු ධාරිතාවය මත, අදාල ක්ෂේත්‍රය පරීක්ෂා කර ලංසු ඉදිරිපත් කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීම වේ. ඒ සඳහා වූ වියදම් කොන්ත්‍රාත්කරු විසින් දැරිය යුතුවේ.** |
| | | **ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන පූර්ව ලංසු රැස්වීමක් (Pre-bid meeting ) 2025.11.18 වන දින පෙ.ව. 11.00 ට ප්‍රධාන කාර්යාලයේ පවත්වනු ලැබේ.** |
| | | මිල යෝජනාවේ සඳහන් මිල ලංසු සඳහා වට්ටම් ලබා දෙන්නේ නම්, ඒවාත් සමග මිළ යෝජනා ඉදිරිපත් කෙරෙන ආකෘති පත්‍රයේ දැක්විය යුත්තේ මිල යෝජනාවේ මුළු ගණන ලෙස වේ. |
| | | **අදාල වන** වැට් බදු මුදල **වෙනම පෙන්වා දිය යුතුවේ.** |
| | | **ගැලපුම් කරගැනීමේ අදහසින් ඉදිරිපත් කර ඇති මිල යෝජනා නොදැක් වූ ප්‍රතිචාර ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.** |
| **3.4** | යෝග්‍යතාව තහවුරු කරන ලේඛණ සාක්ෂි | **මින් පෙර වසර 10 ක්තුළ සිදු කරන ලද විදුලි වැට සැකසීම පිළිබඳ තහවුරු කර ගත හැක වන අයුරින් ලංසු කරු විසින් ලිඛිත සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරිම මක් මිල යෝජනාවේ ඇතුළත් කළ යුතු වේ .**<br><br>**සියලුම ලිඛිත සාක්ෂි, ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය. උපකරණ අත්‍යවශ්‍ය තාක්ෂණ හා ක්‍රියාකාරීත්ව විශේෂ ලක්ෂණ ඇතුලත් වන පරිදි අයිතමයෙන් අයිතමයට පුළුල් පැහැදිලි කිරීම් ඊට ඇතුළත් විය යුතු වේ.** |
| **3.5** | මුදල් වර්ගය | ලංසුකරුවන් විසින් මිල ලංසු ඉදිරිපත් කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලින් පමණි. |
| **3.6** | මිල ලංසුවල වලංගු කාලය | **ලංසුකරුවන් වෙත ලංසු ඉදිරිපත් කිරිමට ලබාදී ඇති, අවසාන දිනෙන් පසු ඉදිරියට දින අනූ එකක (91) කාලයක් මිල ලංසු වලංගු විය යුතුය.** |

## 4. (ඈ). මිල ලංසු ඉදිරිපත් කිරීම හා මිල ලංසු විවෘත කිරීම

| | | |
|---|---|---|
| **4.1** | මිල ලංසු ලේඛන ඉදිරිපත් කිරිම | ලංසු ඉදිරිපත් කිරීම සඳහා **රත්මලාන පිහිටි කජු සංස්ථා ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් 2025.11.07 දින සිට 2025.11.26 දින දක්වා රාජකාරී දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා ලංසු ලේඛන ලබාගත හැක.** ලංසු ලේඛන ලබාගැනීමට **ආපසු නොගෙවනු ලබන රු: 3500.00 ක (රැපියල් තුන්දහස් පන්සීයක් පමණි)** තැන්පතුවක් සංස්ථා ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා රිසිට් පත ඉදිරිපත් කිරීමෙන් පසුව ලබාගත හැක. ලංසු ඉදිරිපත් කරන විට අදාල ලදුපතේ මුල් පිටපතක් මිල ලංසු සමඟ ඉදිරිපත් කළ යුතුය. |
| | | **ලංසු ඉදිරිපත් කිරීමේදී ආපසු ගෙවනු ලබන රු:366,000.00ක ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතුය. ලංසු සුරක්ෂණයේ වලංගු කාලය ලංසු විවෘත කරන දිනයේ සිට දින 28 කට නොඅඩු විය යුතු අතර, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. මුදල් තැන්පතුවක් මගින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කරන්නේ නම්, 2025.11.26 වන දින ප.ව. 3.00 ට ප්‍රථම ශ්‍රී ලංකා කජු සංස්ථාවේ සරප් වෙත මුදල් ගෙවූ බවට ඒ සඳහා වූ ලදුපතෙහි මුල් පිටපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය.** |

| | | |
|---|---|---|
| | | නිසිපරිදි සම්පූර්ණ කරන ලද ලංසු " මුල් පිටපත " හා " අනු පිටපත " වශයෙන් පිළියෙල කර, **වම්පස ඉහළ කෙළවරේ උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය සටහන් කර,** වෙන වෙනම කවර දෙකක බහා **නැවත එම කවර දෙක මුද්‍රා තබන ලද තනි කවරයක බහා, එම කවරයේ වම්පස ඉහළ කෙළවරේ උක්ත සඳහන් ප්‍රසම්පාදන නාමය හා අංකය සටහන් කර ඉදිරිපත් කළ යුතුය.** |
| | | මිල යෝජනාව යතුරු ලේඛනය කිරීමෙන් හෝ නොමැකෙන තීන්තෙන් ලිවියයුතු අතර, ලංසුකරු හෝ ලංසුකරු විසින් බලය පවරා දෙනු ලැබුවකු විසින් අත්සන් කළයුතුවේ. |
| | | **උපදෙස් දී ඇති පරිදි මිල ලංසු ලේඛන මුද්‍රා තබා නොතැබීමෙන් හා සලකුණු නොයෙදීමෙන් වන අස්ථානගතවීම් හා බලාපොරොත්තු රහිත විවෘත කිරීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව වගකියනු නොලැබේ.** |
| | | සම්පූර්ණ කරන ලද මිල ලංසු **2025.11.27** වන දින ප.ව. **2.00** හෝ ඊට පෙර ලැබෙන පරිදි, පහත ලිපිනයට ලියාපදිංචි / කුරියර් තැපෑලෙන් හෝ සංස්ථා ප්‍රධාන කාර්යාලයේ පාලන අංශයේ තබා ඇති **අංක - 02 ටෙන්ඩර් පෙට්ටියට** අතින් ගෙනවිත් බහාලිය හැකිය. **ප්‍රමාදවී ලැබෙන සහ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.**<br><br>**සභාපති,**<br>**ප්‍රසම්පාදන කමිටුව,**<br>**ශ්‍රී ලංකා කජු සංස්ථාව,**<br>**තෙලවල පාර,**<br>**රත්මලාන.** |
| **4.2** | ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය | **මිල ලංසු ඉදිරිපත් කිරීම 2025.11.27 ප.ව 2.00 ට අවසන් වේ.** |
| | | **ප්‍රමාදවී ලැබෙන සහ නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.** |
| **4.3** | **මිල ලංසු විවෘත කිරීම.** | **ලංසු විවෘත කිරීම 2025.11.27 ප.ව 2.15 රත්මලාන ප්‍රධාන කාර්යාලයේදී සිදුකරනු ලැබේ.** එම අවස්ථාව සඳහා අදාල ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට සහභාගී විය හැක. |
| **5. (ඉ). මිල ලංසු ඇගයීම හා සංසන්දනය කර බැලීම** | | |
| **5.1** | පැහැදිලි කිරීම | මිල යෝජනා පරීක්ෂා කිරීමේදී, ඇගැයීමේදී හා සංසන්දනය කිරීමේදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව තම අභිමතය පරිදි තමන්ගේ මිල ලංසු පිළිබඳ පැහැදිලි කිරීමක් කරන ලෙස ලංසු කරුවෙකුගෙන් ඉල්ලා සිටිය හැකි වේ. ලංසු කරුවෙකු විසින් තම මිල ලංසු පිළිබඳව කරන පැහැදිලි කිරීම, එම මිල ලංසු සංශෝධනය කිරීම සඳහා හිමිවන අවස්ථාවක් නොවේ. එබඳු ඉල්ලීම් කරනු ලැබුව ද මුල් මිල ලංසු සංශෝධනය සඳහා සලකා නොබැලේ. |
| | | පැහැදිලි කිරීම පිළිබඳ ඉල්ලීම හා ඊට දක්වන ප්‍රතිචාරය ලිඛිතව සිදුවිය යුතු වේ. |
| | | ලැබී ඇති යෝජනාවල අන්තර්ගත කරුණු මත මිල යෝජනා ප්‍රතිචාරාත්මක ද නැද්ද යන්න ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරනු ඇත. |

| | | |
|---|---|---|
| | | මිල යෝජනාවක් ඇගැයීමට ලක්කිරිමෙන් පසු සාරානුකූලව ප්‍රතිචාරාත්මක නොවේ යයි හැඟී ගිය හොත් එබඳු යෝජනා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරනු ඇත. |
| | | සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇතැයි තීරණය කරනු ලැබ ඇති මිල යෝජනා පමණක් ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ඇගැයීමට ලක් කෙරේ. |
| | | මිල යෝජනාවක් ඇගැයීමේදී ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව පහත දැක්වෙන කරුණු සලකා බලයි.<br><br>(අ) ඉදිරිපත් කර ඇති මිල ලංසු<br>(ආ) ගණිතමය වැරදි, නිවැරදි කිරිම සඳහා මිල ගැළපීම්<br>(ඇ) ලබා දෙන වට්ටම් සඳහා මිල ගැළපීම්<br>(ඈ) නිසි පරිදි සම්පූර්ණ කර තිබීම හා අත්සන් යොදා තිබීම.<br>(ඉ) ඉල්ලා ඇති අදාල ලිපි ලේඛන සියල්ල නිසි පරිදි සම්පූර්ණ කර අමුණා තිබීම.<br>(ඊ) අවශ්‍යතා උපලේඛනවල සඳහන් නිර්ණායක සම්පූර්ණ කර තිබීම.<br>(උ) මින් පෙර මෙවැනිම ක්‍රියාවන් සඳහා වූ අත්දැකීම් |
| **5.2** | කවර හෝ මිල යෝජනාවක් පිළිගැනීම, ප්‍රතික්ෂේප කිරිම හෝ සියළුම යෝජනා ප්‍රතික්ෂේප කිරිම | **මේ සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන මණ්ඩලය සතු වේ.** |
| **6. (ඊ). ලංසු ප්‍රදානය කිරීම** | | |
| **6.1** | මිල යෝජනාවක් පිළිගැනීම. | **ලංසු ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇති පිරිවිතරයන්ට සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති, අවම මිල ලංසු ඉදිරිපත් කර ඇති ලංසුකරුවන්ගේ මිල යෝජනා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් පිළිගනු ලබයි.** |
| | | ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද මිල ලංසු පිළිගත් බවට, ලංසුවල වලංගු කාලය ඉක්මයාමට පෙර ලංසුකරුට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් ලිඛිතව දන්වනු ඇත. |
| | | ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු වෙත අදාල ටෙන්ඩරය ප්‍රදානය කිරීමෙන් අනතුරුව, සංස්ථාව විසින් ලබාදෙන ලද කාලසීමාව තුල “ **ඇමුණුම 01** ” හි සඳහන් පිරිවිතරයන්ට අනුකූලව අදාල කාර්යය සිදුකල අවසන් කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| **6.2** | අත්තිකාරම් ගෙවීම | ලංසුකරුට අදාල ප්‍රසම්පාදන කාර්යය සිදුකිරීම සඳහා අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටිය හැකිය. අත්තිකාරම් ලබාගැනීම සඳහා කොන්ත්‍රාත්කරු විසින් ලිඛිත ඉල්ලීමක් සිදුකල යුතු අතර, මුළු ලංසු වටිනාකමින් සියයට තිහක (30%) උපරිමයක් අත්තිකාරම් වශයෙන් ලබාදෙනු ලැබේ. ඒ සඳහා ඉල්ලා සිටින මුදලට සමාන බැංකු ඇපකරයක්, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය. අවම වශයෙන් අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටින දිනයේ සිට දින අනූවක (90) කාලයක් සඳහා බැංකු ඇපකරය වලංගු විය යුතුවේ. |
| **7. (උ). කාර්යය සාධන සුරක්ෂණය** | | |
| **7.1** | කාර්යය සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීම | කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත් ගිවිසුම උල්ලංඝනය කළහොත් ප්‍රසම්පාදන අස්ථිත්වය ආරක්ෂා කිරීම සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් 6% ක මුදලක් කාර්යය සාධන සුරක්ෂණයක් ලෙස ඉදිරිපත් කලයුතු වේ. මෙම සුරක්ෂණය මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කර තිබිය යුතුය.එහි වලංගු කාලය අදාල ගිවිසුම්ගත කොන්ත්‍රාත් කාර්යය නිම කිරීමට අපේක්ෂිත දිනයෙන් ඔබ්බට දින 28 ක් දක්වා වලංගු විය |
| **8. (ඌ). කොන්ත්‍රාත් කාර්යය සිදුකිරීම** | | |
| **8.1** | කොන්ත්‍රාත්තුව සිදුකලයුතු කාලසීමාව | විදුලි වැට ඉදිකිරීමේ වැඩ කටයුතු, ප්‍රසම්පාදන මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරු තෝරාගැනීමෙන් අනතුරුවටෙන්ඩරය වලංගු කාල සීමාව ඉක්ම වීමට ප්‍රථම සියලු කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා දින (90) කාලසීමාවක් කොන්ත්‍රාත්කරු වෙත හිමිවේ.<br>එම කාලසීමාව තුල සියළු කටයුතු අවසන් කර, ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත භාරදිය යුතුය.. |

# II කොටස

# දත්ත පත්‍රිකාව

| අයි ටී බී වගන්තියේ යොමුව | |
|---|---|
| **1.1** | **ආයතනය** : ශ්‍රී ලංකා කජු සංස්ථාව<br>**ලිපිනය** : තෙලවල පාර, රත්මලාන |
| **11.1** | **ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලිපිනය :**<br><br>සභාපති,<br>ප්‍රසම්පාදන කමිටුව,<br>ශ්‍රී ලංකා කජු සංස්ථාව,<br>තෙලවල පාර,<br>රත්මලාන.<br><br>**ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනය හා වේලාව :** 2025.11.27 ප.ව. 2.00<br>**ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව :** 2025.11.27 ප.ව. 2.15 |
| **11.2** | <u>**ප්‍රසම්පාදන නිර්ණායකයන් :**</u><br><br>**1.** මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් කොණඩච්චි වතුයායේ කිලෝමීටර් 26 ක් දිගු විදුලි වැටක් ඉදිකිරීම සඳහා පිළිගත් කොන්ත්‍රාත්කරුවන් මඟින් මුද්‍රා තබන ලද මිල ලංසු කැඳවනු ලැබේ.<br><br>**2.** රජයේ කොන්ත්‍රාත් සිදුකිරීම සඳහා කොන්ත්‍රාත්කරුහට පිළිගත් සහතික පත්‍රයක් තිබීම (ICTAD හෝ CIDA) අනිවාර්ය වේ. උදා:- ICTAD ශ්‍රේණිගත කිරීමේ C7 හෝ ඉහළ ශ්‍රේණියක විය යුතුය. (ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න)<br><br>**3.** බිම් කොටසෙහි කිලෝමීටර් ප්‍රමාණය **26 කි.**<br><br>**4.** විදුලි වැට ඉදිකිරීම සඳහා වන මුදල සියලු බදු රහිතව හා බදු සහිතව සඳහන් කල යුතුය.<br><br>**5.** කැලය එළිකිරීමේ වැඩ කටයුතු, ප්‍රසම්පාදන මණ්ඩලය විසින් කොන්ත්‍රාත්කරු තෝරාගැනීමෙන් අනතුරුව ටෙන්ඩරය ප්‍රදාන කරන අවස්ථාවේදී දැනුම්දීමට කටයුතු කරනු ඇත. එම කාලසීමාව තුල අදාල විදුලි වැටහි වැඩ කටයුතු අවසන් කර, එම කාලසීමාව ඇතුලත ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත භාරදිය යුතුය.<br><br>**6. විදුලි වැට ඉදි කර භාරදියයුතු නියමිත දිනයෙන් පසු ප්‍රමාද වන සෑම එක් දිනයක් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට එකක (01%) ප්‍රමාද ගාස්තුවක්, කොන්ත්‍රාත්කරු විසින් ශ්‍රී ලංකා කජු සංස්ථාව වෙත මුදලින් ගෙවිය යුතුවේ.**<br><br>**7.** විදුලි වාට ඉදිරීම සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් ලබාදෙන පහත උපදෙස් පිළිපැදීමට ඔබ බැඳී සිටිනු ඇත.<br><br>**(A) අදාල ප්‍රධාන තාක්ෂණික පිරිවිතරයන් -**<br><br>1. මිල ගණන් කිලෝ මීටර් 26 වු විදුලි වැටහි අදාළ සියළුම කාර්යයන් සඳහා ඉදරිපත් කල යුතු වේ.<br>2. වැටේ ව්‍යුහය -උසස් තත්වයේ ගැල්වනයිස් කළ කම්බි පොට හතරක්(04) සහිතවිදුලි වැට පද්ධතියක් වේ.<br>3. විදුලි සම්පාදක යන්ත්‍රය ( Energizer ) -අවම 18 ජූල් ( Joules) ධාරිතාවයක් තිබිය යුතු වේ<br>4. සූර්ය බලශක්ති පද්ධතියක් -140W-150W (135A) පැනලයක් සහ 12V, 90A බැටරි උපකරණ යුක්ත විය යුතු වේ<br>5. Grounding පද්ධතිය ඇතුලත් විය යුතුය<br>6. Spring gate ( ගේට්ටු) - 02 ක් ඇතුලත් විය යුතුය<br>7. වැටකණු ( GI) අඩි 9 උස , අගල් 3 විශ්කම්භය හා 2.9 මි.මී |

| | |
|---|---|
| | සනකමින් යුතු ගැල්වනයිස් වානේ බට වේ.<br>8. පැති හා ආධාරක කණු - දැව සංස්ථාවේ පදම්කළ ලී කණු වේ<br>9. අඩි 8X2 ප්‍රමාණයේ ගැල්වනයිස් කම්බි දැල ( වැට කණු ආරක්ෂාව සඳහා ) අඩංගු වේ<br><br>**(B). ප්‍රධාන ඉදිකිරීම් පියවර**<br>1. වැට ඉදිවන දිග ප්‍රමිණය මීටර්10 ක් පළල ට ශුද්ධ කළ යුතු අතර , එහි මධ්‍යයේ මීටර් 05 ක් පළලට මිලි .මී 75 -150 ක ගැඹුරට මතුපිට පස් ඉවත් ලබ යුතු වේ.<br>2. ඉදිකිරීම් ස්ථානයට උපකරණ ප්‍රවාහනය<br>3. වැට කණු ස්ථාපනය විදුලි වැට ඉදි කිරීම<br>4. බලශක්ති කුටි 03 ක් අදාළ පිරිවිතර පරිදි ඉදිකිරිම<br>5. පද්ධතිය පරීක්ෂා කිරිම සහ භාවිතයට උපදෙස් පිලිබඳ කප්‍රු සංස්ථා නිලධාරීන්ට පුහුණුවක් ලබා දීම<br><br>**<u>කොන්දේසි :</u>**<br><br>**I.** වැට ඉදිවන මාර්ගය සඳහා D8/ D7 / D6 / D4 වර්ගයේ ඩෝසර් යන්ත්‍ර භාවිතා කලයුතු වේ. D8 /D7 / D6 වර්ගයේ යන්ත්‍ර භාවිතා කරන්නේනම්, අවම වශයෙන් යන්ත්‍ර දෙකක් (02) හා , D4 යන්ත්‍ර භාවිතා කරන්නේනම්, අවම වශයෙන් යන්ත්‍ර තුනක් (03) ක් කිරීම වඩා සුදුසු වේ.<br><br>**II.** වැට ඉදිවන මාර්ග තුල නොකැපිය යුතු වාණිජමය වටිනාකමකින් යුතු ශාකයන් පෙන්නුම්කර දීමට, සංස්ථාව කටයුතු කරන අතර, එම ශාකයන් නොකැපිය යුතුවේ.<br><br>**III.** කැලය එළිකරන ලද භූමි ප්‍රදේශයේ ගස් හෝ ඉන් පිටස්තර සංස්ථාවට අයිති භූමි ප්‍රදේශයන්හි ගස් හෝ දර කිසිම විටෙකවත් කපා අදාල භූමියෙන් පිටතට ඉවත්කර ගැනීම සපුරා තහනම් වේ.<br><br>**IV.** වැට ඉදිවන මාර්ග භූමි ප්‍රදේශයෙහි කප්‍රු සංස්ථාව විසින් පෙන්නුම් කර දෙනු ලබන නොකැපිය යුතු ගස් හැර අනෙකුත් සියලුම ගස් මුල් සමඟ පොළව මට්ටමින් උදුරා දැමිය යුතු අතර, ලදු කැලය ද මුල් ගැලවෙන පරිදි ගැලවීමට කටයුතු කල යුතුය. (මතුපිට පස් ස්ථරයට හානි නොවන පරිදි)<br>**V.** මේ සමග ඉදිරිපත් කර ඇති ඇමුණුම 01 සදහන් උපකරණ වලට අදාළ වන පිරිවිතර අනුව භාණ්ඩ සැපයීම සිදු කළ යුතුවේ .<br>**VI.** විදුලි වැට ඉදිකිරීම අදාළ භාණ්ඩ හා උපකරණ වලට අදාළ වගකීම් කාල සීමාවන් පැහැදිලිව දක්වා සිටිය යුතුය.. |
| **11.3** | |
| **11.4** | මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් සඳහා අවශ්‍ය වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවේ **දුරකථන අංක (011-2607485 )**මගින් ලබාගත හැකිය. |

## II කොටස

## අවශ්‍යතා උපලේඛනය I

| අනු අංකය | විස්තරය | විස්තර | උපදෙස් |
|---|---|---|---|
| 01 | රු. 366,000.00 ක ලංසු සුරක්ෂණය ගෙවීමට අදාල රිසිට්පත / බැංකු සුරක්ෂිතය අමුණා තිබීම. | ඔව්/ නැත | |
| 02 | රු. 366,000.00 ක ලංසු සුරක්ෂණය ගෙවීමට අදාල රිසිට්පත් අංකය*/ බැංකු සුරක්ෂිතයේ යොමු අංකය. | | * සටහන් කරන්න |
| 03 | ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු, ලංසු ඉදිරිපත් කිරීමේදී තබන ලද ආපසු ගෙවනු ලබන රු. 366,000.00 ක ලංසු සුරක්ෂණය, නැවත කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කරනු ලබනුයේ ගිවිසුම්ගත කාර්යය අවසන් වූ පසුව වේ. | එකඟ වේ / එකඟ නොවේ. | |
| 04 | සාර්ථක ලංසුකරු තෝරාගත් පසු අනෙකුත් ලංසු කරුවන්ගේ ලංසු සුරක්ෂණය නිදහස් කල හැක. සාර්ථක ලංසුකරු කාර්ය සාධන සුරක්ෂණය ඉදිරිපත් කිරීමෙන් පසු ලංසු සුරක්ෂණය නිදහස් කල හැක. | එකඟ වේ / එකඟ නොවේ. | |

## අවශ්‍යතා උපලේඛනය II

| අනු අංකය | විස්තරය | ඔව්/නැත/විස්තර | ඇමුණුම ඉදිරිපත් කර ඇත/නැත |
|---|---|---|---|
| 01 | රජයේ කොන්ත්‍රාත් සිදුකිරීම සඳහා පිළිගත් සහතික පත්‍රයක් (ICTAD හෝ CIDA) තිබීම අනිවාර්ය වේ.<br>උදා:- ICTAD ශ්‍රේණිගත කිරීමේ C7 හෝ ඉහළ ශ්‍රේණියක වියයුතුය. (ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න.) | ශ්‍රේණිය - ............ | |
| 02 | පසුගිය වසර දහයක් (10) කාලසීමාවක රජයේ කොන්ත්‍රාත් සාර්ථකව සිදුකරන ලද බවට ලිපිලේඛන (තහවුරු කිරීමේ ලිපිලේඛණ ඉදිරිපත් කළ යුතුය) | ප්‍රමාණය - ........... | |
| 03 | ආයතන ව්‍යුහය ආයතනයේ නම, ව්‍යාපාරය ලියාපදිංචි අංකය, ඒ සඳහා අදාල සහතික පත්‍ර, සේවක සංඛ්‍යාව ආදී අනෙකුත් තොරතුරු | | |
| 04 | පසුගිය වසර දහයක් (10) තුලදී රජයේ කොන්ත්‍රාත් සඳහා මිල ගණන් ඉදිරිපත් කරන ලද ප්‍රමාණය | | |
| 05 | අදාළ කාර්යය නියමිත දිනට සිදු කිරීම සඳහා අදාළ කාල රාමුව හා ක්‍රියාකාරි සැලැස්ම. | | * සටහන් කරන්න. |

*** මාර්ගය ඉදිකිරීම සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත යන්ත්‍ර වර්ගය හා එහි ධාරිතාවය**

| | වර්ගය | යොදවන යන්ත්‍ර ගණන | අශ්වබල ධාරිතාවය | කුලී පදනමට යොදන යන්ත්‍ර ගණන |
|---|---|---|---|---|
| ඩෝසර් | | | | |
| එක්ස් කැවේටර් | | | | |

# IV වන කොටස

## <u>තාක්ෂණික පිරිවිතර හා පිරිවිතරවල අනුකූලතාව</u>

01. රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ලියාපදිංචි ආයතනයක් (ICTAD හෝ CIDA) විය යුතු අතර, එය සනාථ කිරීම සඳහා අදාල ලේඛන ඇමිණිය යුතුය. උදා:- ICTAD ශ්‍රේණිගත කිරීමේ C7 හෝ ඉහළ ශ්‍රේණියක වියයුතුය.

02. වට ඉදිවන මාර්ය එළි කිරීම සඳහා භාවිතා කිරීමට අපේක්ෂිත යන්ත්‍ර වර්ගය හා එහි ධාරිතාවය

උදා :- D7, D8

භූමිය එළිකිරීම සඳහා භාවිතා කරනු ලබන යන්ත්‍ර වර්ගය හා ධාරිතාවය පැහැදිලිව වෙන් වෙන්ව දක්වා තිබිය යුතුය.

03. වැඩ කටයුතු සිදුකරන ආකාරය ක්‍රමවත්ව සකස් කරන ලද දින 10 බැගින් වූ කාල සටහනකින් ඉදිරිපත් කළයුතු වේ. එක් එක් කාල සීමාවේදී නිම කිරීමට නියමිත වැඩ කොටස පැහැදිලිව දක්වා තිබිය යුතුය.

පහත ආකෘතිය උපයෝගි කරගැනීමට කටයුතු කරන්න. එය ඇමුණුමක් ලෙස මිල ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුවේ.

**උදාහරණයක් :-**

| කාළ සීමාව | දින ගණන | නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් |
|---|---|---|
| | | |
| | | |
| | | |

## V වන කොටස

**<u>මිල උපලේඛණය</u>**

**ලංසු සුරක්ෂණය (අදාළ මුදල සරප් වෙත ගෙව්වේ නම්)**

රු. 366,000.00 ලංසු සුරක්ෂණය ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත නොගැලවෙන ලෙස පහත කොටුවෙහි අලවන්න. **(එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබාගන්න.)**

රු. 366,000.00 ලංසු සුරක්ෂණය ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත ඉහතින් අලවා ඇත.

අත්සන : ______________________

# VI වන කොටස

## <u>මිල උපලේඛණය</u>

**ලංසු ලේඛන ලබා ගැනීම සඳහා**

රු. 3,500.00 ලංසු ලේඛන ලබා ගැනීම සඳහා ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත නොගැලවෙන ලෙස පහත කොටුවෙහි අලවන්න. **(එහි ඡායා පිටපතක් ඔබ ළඟ තබාගන්න.)**

| |
|---|
| |

රු. 3,500.00 ලංසු ලේඛන ලබා ගැනීම සඳහා ගෙවන ලද රිසිට් පතේ මුල් පිටපත ඉහතින් අලවා ඇත.

අත්සන : ______________________

## VII වන කොටස

**<u>කාර්ය සාධන සුරක්ෂණය සඳහා ආකෘති පත්‍රය</u>**

....................................................... (නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම) ................................. (නිකුත් කරන ශාඛාවේ/කාර්යාලයේ ලිපිනය)

ප්‍රතිලාභියා : ................................................ (සේවාදායකයාගේ නම සහ ලිපිනය)

දිනය : ................................................

**<u>කාර්ය සාධන සුරක්ෂණයේ අංකය : .........................................................</u>**

මෙහි මින් මතුවට කොන්ත්‍රාත්කරු වශයෙන් හඳුන්වනු ලබන .................................................. (කොන්ත්‍රාත්කරු/සැපයුම්කරුගේ නම) අංක .................................... දරන ............................... දිනැති කොන්ත්‍රාත්තුවේ ........................................................................................................................ සඳහා (මෙහි මින් මතුවට "කොන්ත්‍රාත්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) ........................................................... ......................................................... (කොන්ත්‍රාත්තුවේ නම සහ වැඩ ගැන කෙටි විස්තරයක් සඳහන් කරන්න) ඔබ ඇතුලත් වූ බව අපට දැනුම් දී ඇත.

තවදුරටත්, කොන්ත්‍රාත්තුවේ කොන්දේසිවලට අනුකූලව කාර්යය සාධන සුරක්ෂණයක් අවශ්‍ය බව අපි දනිමු.

කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම පරිදි අපි ................................................ (නිකුත් කරන නියෝජ්‍යායතනයේ නම) කොන්ත්‍රාත්තුවේ කොන්දේසි අනුකූලව කොන්ත්‍රාත්කරු බැඳීම් උල්ලංඝනය කර ඇති බවට ඔබ වෙතින් ලැබෙන ලිඛිත ප්‍රකාශය සහිත ප්‍රථම ලිඛිත ඉල්ලීම අප වෙත ලැබුණු පසු ඔබගේ ඉල්ලීම සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කිරීමේ හෝ ඔබගේ ඉල්ලීමට හේතු සාධක දැක්වීමට හෝ එහි නිර්දිෂ්ඨ මුදල සනාථ කිරීමට හෝ සඳහා අවශ්‍යතාවයෙන් තොරව එහි සඳහන් .................................................................. (මුදල ඉලක්කමෙන් / මුදල අකුරින් සඳහන් කරන්න) නොඉක්මවන ඕනෑම මුදල් ප්‍රමාණයක් හෝ ප්‍රමාණයන් අහෝසි කර ඔබට ගෙවීමට අපි භාර ගනිමු. එම මුදල කොන්ත්‍රාත් මුදල ගෙවිය යුතු මුදල් වර්ගයකින් සහ එම ව්‍යවහාරික මුදල්වල පරිවර්තික වටිනාකමින් විය යුතුය.

මෙම සුරක්ෂණය අවම වශයෙන් ............................. දිනට අවසන් වනු ඇති අතර, (කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් සඳහන් කරන්න) ගෙවීම් සඳහා කරනු ලබන ඕනෑම ඉල්ලීමක් එදිනට හෝ එදිනට පෙර මෙම කාර්යාලයට ලැබිය යුතුය.

....................................

අත්සන / අත්සන්

| කාර්යාල ප්‍රයෝජනය සඳහා මුදල් ගෙවූ ලදුපත් අංකය : ...................... |
|---|

VIII වන කොටස

| මුල් පිටපත |
|---|

SLCC
SRI LANKA CASHEW CORPORATION

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## කොණ්ඩච්චි වතු යාය වටා කිලෝමීටර් 26 ක් දිගු (අලි) විදුලි වැටක් ඉදිකිරීම.

ප්‍රසම්පාදන අංකය : SLCC/ADM/PRO/84/2024 – 2025-*30*

## මිල ලංසු ඉදිරිපත් කිරීම

| ශ්‍රී අංකය | වතු යාය | කිලෝ මීටර් ප්‍රමාණය | වැය වන මුළු මුදල (රු) | | |
|---|---|---|---|---|---|
| | | | වැට්බදු රහිත | වැට්බදු මුදල | වැට්බදුසහිත |
| 1 | | 26 | | | |

**ඉහත අනු අංක 01 සඳහා වැය වන මුළු මුදල,**

වැට් බදු සහිතව (ඉලක්කමෙන්) : ..............................................................................................

වැට් බදු සහිතව (අකුරින්) : ..............................................................................................

වැට් බදු රහිතව (ඉලක්කමෙන්) : ..............................................................................................

වැට් බදු රහිතව (අකුරින්) ..............................................................................................

**බව මෙයින් දන්වා සිටිමි.**

**(අ)** **අප වෙත ලබාදී ඇති ලංසු ලේඛනවලට එකඟවන බවත්, අවශ්‍යතා ලේඛණයේ භාරදීමේ පත්‍රිකාවල සඳහන් ආකාරයට මෙහි නම් කර ඇති සේවාව සැපයීමටත් අපි ඉදිරිපත් වෙමු.**

**(ආ)** **අපගේ මිල යෝජනාව, අයි ටී බී 11.1 උප වගන්තියේ මිල යෝජනා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය වශයෙන් අයි ටී බී 8.1 උප වගන්තියේ දැක්වෙන කාලසීමාව සඳහා වලංගුව පවතී. ඊට අපි බැඳී සිටින අතර, කල් ඉකුත් වන දිනට පෙර කවර අවස්ථාවක හෝ භාරගනු ලැබේ.**

**(ඇ)** **මෙම මිල යෝජනාවක්, කොන්ත්‍රාත්තුව පිරිනැමෙන බව දන්වා එව් ලිඛිත දැන්වීමෙන් එය පිළිගැනීමක් නිසා අප දෙපාර්ශවය අතරේ ගිවිසුමක් ඇති කෙරෙන බව වටහා ගනිමු.**

**(ඇ)** **ඇගැයීමට ලක් කෙරුන අඩුම ලංසුව ඇති මිල යෝජනාව හෝ වෙනත් කිසියම් මිල යෝජනාවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව අපි විශ්වාස කරමු.**

ආයතනයේ / කොන්ත්‍රාත්කරුගේ නම : ..............................................................................................

ලිපිනය : ..............................................................................................

දුරකථන අංක : ..............................................................................................

**....................................................**

**දිනය : ...........................** අත්සන සහ නිල මුද්‍රාව

| කාර්යාල ප්‍රයෝජනය සඳහා |
|---|
| මුදල් ගෙවූ ලදුපත් අංකය : ..................... |

| අනු පිටපත |
|---|

**VIII** වන කොටස

SRI LANKA CASHEW CORPORATION

# ශ්‍රී ලංකා කජු සංස්ථාව

## කොණ්ඩච්චි වතු යාය වටා කිලෝමීටර් 26 ක් දිගු (අලි) විදුලි වැටක් ඉදිකිරීම.

**ප්‍රසම්පාදන අංකය : SLCC/ADM/PRO/84/2024 – 2025-30**

## මිල ලංසු ඉදිරිපත් කිරීම

| ශ්‍රී | වතුයාය | කිලෝමීටර් ප්‍රමාණය | කිලෝමීටර් 26 ක් සඳහා වැය වන මුළු මුදල (රු) | | |
|---|---|---|---|---|---|
| | | | වැට්බදු රහිත | වැට් බදු මුදල | වැට්බදු සහිත |
| 1 | | 26 | | | |

**ඉහත අනු අංක 01 සඳහා වැය වන මුළු මුදල,**

වැට් බදු සහිතව (ඉලක්කමෙන්) : ........................................................................................................

වැට් බදු සහිතව (අකුරින්) : ........................................................................................................

වැට් බදු රහිතව (ඉලක්කමෙන්) : ........................................................................................................

වැට් බදු රහිතව (අකුරින්) : ........................................................................................................

**බව මෙයින් දන්වා සිටිමි.**

**(අ)** අප වෙත ලබාදී ඇති ලංසු ලේඛනවලට එකඟවන බවත්, අවශ්‍යතා ලේඛණයේ භාරදීමේ පත්‍රිකාවල සඳහන් ආකාරයට මෙහි නම් කර ඇති සේවාව සැපයීමටත් අපි ඉදිරිපත් වෙමු.

**(ආ)** අපගේ මිල යෝජනාව, අයි ටී බී 11.1 උප වගන්තියේ මිල යෝජනා ඉදිරිපත් කිරීමේ අවසාන දිනය වශයෙන් අයි ටී බී 8.1 උප වගන්තියේ දැක්වෙන කාලසීමාව සඳහා වලංගුව පවතී. ඊට අපි බැඳී සිටින අතර, කල් ඉකුත් වන දිනට පෙර කවර අවස්ථාවක හෝ භාරගනු ලැබේ.

**(ඇ)** මෙම මිල යෝජනාවක්, කොන්ත්‍රාත්තුව පිරිනැමෙන බව දන්වා එව් ලිඛිත දැන්වීමෙන් එය පිළිගැනීමක් නිසා අප දෙපාර්ශවය අතරේ ගිවිසුමක් ඇති කෙරෙන බව වටහා ගනිමු.

**(ඈ)** ඇගැයීමට ලක් කෙරුන අඩුම ලංසුව ඇති මිල යෝජනාව හෝ වෙනත් කිසියම් මිල යෝජනාවක් පිළිගැනීමට ඔබ බැඳී නැති බව අපි විශ්වාස කරමු.

ආයතනයේ / කොන්ත්‍රාත්කරුගේ නම : ........................................................................................

ලිපිනය : ........................................................................................

දුරකථන අංක : ........................................................................................

**....................................................**
අත්සන සහ නිල මුද්‍රාව

**දිනය : ...........................**

ශ්‍රී ලංකා කජු සංස්ථාව

# ගිවිසුම් පත්‍රය

## කොණ්ඩච්චි වතු යාය වටා කිලෝමීටර් 26 ක් දිගු (අලි) විදුලි වැටක් ඉදිකිරීම

**ප්‍රසම්පාදන අංකය : SLCC/ADM/PRO/84/2024 - 2023-30**

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ අංක. 60/7 දරණ 1973.05.25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ස්ථාපනය කරන ලද්දා වූ, තෙලවල පාර ,රත්මලාන යන ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා කජු සංස්ථාව පළමු පාර්ශවය ලෙසට ද,

............................................................ යන ලිපිනයේ පිහිටි .............................................. ආයතනය දෙවන පාර්ශවය ලෙසට ද, බැඳී එකී දෙපාර්ශවය විසින් වර්ෂ 2025 ක් වූ .................. වන දින කොළඹ දී ඇති කර ගන්නා ලද ගිවිසුම් පත්‍රයයි.

**01.** තෝරාගත් කොන්ත්‍රාත්කරු වන ........................................................ ලිපිනයේ පදිංචි .............................................. ආයතනය විසින් ඉදිරිපත් කර ඇති ලංසු ලේඛන මෙම ගිවිසුමට “ඇමුණුම ....” වශයෙන් යා කර ඇත.

**02.** ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් මන්නාරම දිස්ත්‍රික්කයේ මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සිලාවතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොණ්ඩච්චි වතුයායේ **කිලෝමීටර 26 ක විදුලි වැට ඉදිකිරීම සඳහා එය ඉදිවන මාර්ගයේ මීටර් 10 ක ප්‍රමාණයේ** (බිම් සැලැස්ම - ඇමුණුම .....) සලකුණු කර හෝ පෙන්වා දෙනු ලබන ශාක හැර ඉතිරි ශාක, පඳුරු හා තෘණ සියල්ලම ක්‍රමානුකූලව මුල් වලින් ගැලවී යන පරිදි උදුරා මීටර් 25 ක් දුරින් පෙන්වාදෙනු ලබන ස්ථානයේ වැටියක් ලෙස ගොඩ ගසා එම කොටස් පූර්ණව අළුවනතුරු පුළුස්සා මිලි මීටර් 75-150 ක් අතර ගැඹුරට මතුපිට පස් ඉවත් කර, විදුලි වැට ඉදිකර භාරදීම සඳහා ඉහත අංක 01 හි සඳහන් දෙපාර්ශවය විසින් අත්සන් කළයුතු ගිවිසුමෙහි දෙපාර්ශවය විසින් එකඟවිය යුතු කරුණු හා කොන්දේසි පහත I සිට XXIX දක්වා සඳහන්ව ඇත.

**I.** පළමු පාර්ශවය විසින් කොණ්ඩච්චි වතුයායේ කිලෝමීටර් 26 ක භූමි වටා ප්‍රමාණයේ මීටර් 10 ක් පළලට ශුද්ධ කර මීටර් 25 ක් දුරට පෙන්වදෙන ස්ථානයේ වැටියක් ලෙස ගොඩගසා කැලෑ රොඩු පූර්ණව අළු වනතුරු පුළුස්සා එහි මතුපිට පස් මිලි මීටර් 75-150 ක් ගැඹුරට මධ්‍ය රේඛාවේ සිට මීටර් 2.5 දෙපසට ( මීටර් 5 ක් පළලට) ඉවත් කර වැට ඉදිවන මාර්ගයෙන් පිටත තුනි කර විදුලි වැට ඉදිකිරීම 2025.................... වන දින සිට ආරම්භ කල යුතුය. අතර 2025................... දින වන විට එම සියලු වැඩ කොටස් පිරිවිතරානු කුලව හා ගිවිසුමේ සඳහන් පරිදි අවසන් කළයුතු වේ. **ඒ අනුව ඉහත කටයුතු සියල්ල සම්පූර්ණ කිරීම සඳහා දින අනූවක (90) කාලසීමාවක් දෙවන පාර්ශවය වෙත හිමිවී ඇත.**

**II.** දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ලංසු ලේඛනවලට අනුව, කිලෝමීටර් 26 ක් ලෙස සලකුණු කර ඇති දිග ප්‍රමාණය කිරීම සඳහා ලංසු මුදල (සියලු බදු සහිතව) රු. ................................. (රුපියල් ...................... පමණි) වන අතර, එම මුළු කොන්ත්‍රාත් වටිනාකමින් 06% ක් වන රු. ........................ (රුපියල් .................................. පමණි) ක මුදල ලංසු සුරක්ෂිතයක් ලෙස මෙම කොන්ත්‍රාත්තුව ආරම්භ කිරීමට ප්‍රථම මුදලින් හෝ බැංකු ඇපකරයක් නම් එය මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලුවිට ගෙවීම් සිදුකල යුතු, ආපසු හැරවිය නොහැකි ලෙස ඉදිරිපත් කළයුතු වේ. ගිවිසුම්ගත කාර්යය සාර්ථකව අවසන් කිරීමට ලබා දෙනු ලබන අවසන් දිනයේ සිට ඉදිරියට දින 28 කට පසු ඉදකිරීමේ සාර්ථකත්වය මත මෙම ලංසු සුරක්ෂණ මුදල නැවත පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත නිදහස් කරනු ලැබේ.

**III.** නියමිත දිනයේදී වැඩ කටයුතු ආරම්භ කල වහාම, දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඒ පිළිබඳ ලිඛිතව දින පහක් (05) තුලදී දැන්විය යුතුය.

**IV.** දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කර ඇති ලිපි ලේඛනවල සඳහන් කර ඇති පරිදි (අවශ්‍යතා උපලේඛනය II) නියමිත යන්ත්‍රෝපකරණ සියල්ලම ගිවිසුම් ප්‍රකාරව වැඩ ආරම්භ කරන පළමු දිනයේදීම අදාල ක්ෂේත්‍රයේ තිබීම වඩාත් සුදුසුවේ.

**2 වන පිටුවට . . .**

V. දෙවන පාර්ශවය වෙත ගිවිසුම්ගත කාර්යය සඳහා ලබාදී ඇති කිලෝමීටර් 26 ක වැට ඉදිවන මාර්ගයේ ඇති බිම් කොටසේ වැට ඉදිවන මාර්ගයේ මීටර් 10 ක පළල ප්‍රමාණයේ සලකුණු කර හෝ පෙන්වා දෙනු ලබන ශාක හැර ඉතිරි ශාක, පඳුරු හා තෘණ මුලින් ගැලවී යන පරිදි උදුරා ඉවත් කලයුතු වේ.

VI. ඉහත අංක V සඳහන් පරිදි උදුරා ඉවත් කරන ලද ශාක, පඳුරු හා තෘණ කොටස් වැට ඉදි වන මාර්ගයේ සිට මීටර් 25 ක් දුරින් වැටියක් ලෙස ගොඩ ගසා, පූර්ණ වශයෙන් අළුවී යනතුරු පිළිස්සීම, දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතු වේ.

VII. ඉහත VI හි සඳහන් ක්‍රියාවලි මතුපිට පස් එකතු නොවන ලෙස කටයුතු කළයුතු අතර, යම් හෙයකින් මතුපිට පස් එකතු වුවහොත් එලෙස එකතු වූ මතුපිට පස් අදාල පිළිස්සීමේ කටයුතු වලින් පසු නැවත භූමිභාගය පුරා තුනී කරලීමට ද දෙවන පාර්ශවය විසින් කටයුතු කළයුතුය.

VIII. ඉවත් නොකළ යුතු ශාක පළමු පාර්ශවය විසින් නම් කරන ලද නිලධාරියකු විසින් සලකුණු කිරීම හෝ පෙන්වාදීම සිදුකරනු ලබයි. යම් ශාකයක් ඉවත් කිරීම සම්බන්ධව ගැටලුවක් හෝ සැකයක් පවතීනම්, අදාල නිලධාරියාගෙන් විමසා අවශ්‍ය තීරණ ගත යුතුය.

IX. විදුලි වැට ඉදිවන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 2.5 පළලට , එනම් විසින් මීටර් 05 ක් පළලට මිලි.මී 75-150 ක ගැඹුරට මතුපිට පස් ඉවත් කර වැට ඉදිකිරීමට හා බාදාවක් නොවන පරිදි වතුයාය තුලට තුනිකර දැමිය යුතුය.

X. ගිවිසුමට අනුව සිදුකිරීමට ඇති වැඩ කොටස් නිම කිරීම සඳහා දෙවන පාර්ශවය විසින් එකඟතාවය පලකොට ඉදිරිපත් කරන ලද ඉලක්කගත කාර්යයන් සඳහන් කර ඇති කාළ රාමුව , ඇමුණුම ........ මඟින් ගිවිසුමට යා කර ඇත.

XI. ඇමුණුම ........ හි සඳහන් පරිදි අදාල ගිවිසුම්ගත වැඩ කටයුතු නියමිත කාල රාමුවට අනුව අවසන් කරනු ලබන බවට අධීක්ෂණය කිරීම සඳහා පළමු පාර්ශවයේ අභිමතය පරිදි අවස්ථානුකූලව පත්කරනු ලබන නිලධාරීන් දෙනෙකු (02) හා දෙවන පාර්ශවය නියෝජනය කරන නිලධාරීවරයකුගෙන් සමන්විත (01) ත්‍රිපුද්ගල කමිටුවක් පත් කරනු ලැබේ.

XII. දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති ඇමුණුම ...... සඳහන් පරිදි ඉලක්කගත කාර්යය දින 10 බැගින් වූ කාල රාමු තුලදී සම්පූර්ණ කිරීම සඳහා දෙවන පාර්ශවය අපොහොසත් වී ඇති බවට ඉහත XI යටතේ සඳහන් කමිටුව මඟින් නිර්දේශ කර ඇත්නම්, පූර්ව දැනුම්දීමක් සිදුකර දෙවන පාර්ශවය සමඟ අත්සන් කරන ලද ගිවිසුම අවලංගු කිරීමට පළමු පාර්ශවයට බලය පවතී. මෙය ගිවිසුම්ගත වැඩ කටයුතු ආරම්භ කරනු ලබන පළමු කාල රාමුවේ සිටම ක්‍රියාත්මක වන අනිවාර්ය කොන්දේසියක් වේ.

XIII. ගිවිසුම්ගත කාර්යයට සම්බන්ධ භූමිභාගයේ පිහිටි ගස් හෝ ඉන් පිටස්තර පළමු පාර්ශවයට අයිති භූමි භාගයන්හි පිහිටි ගස් දරට කපා විකිණීම, වටිනා දැව ශාක කපා විකිණීම හා පළමු පාර්ශවයට අයත් දේපලවලට හානි කිරීම සපුරා තහනම් වන අතර, එවැනි ක්‍රියා සම්බන්ධයෙන් වාර්තා වුවහොත් දෙවන පාර්ශවය සමඟ ඇති කරගත් ගිවිසුම අහෝසි කිරීමට පළමු පාර්ශවයට බලතල පවතී.එසේ නීති විරෝධි ක්‍රියා සිදුකළ බව වාර්ථා වූ විට ඊට අදාළ රටහි නීතිය අනුව ක්‍රියාකරනු ලැබේ .

XIV. ගිවිසුම්ගත කාර්යයට සම්බන්ධ භූමිභාගයේ හෝ ඉන් පිටස්තර පළමු පාර්ශවයට අයිති භූමි භාගයන්හි වන සතුන් දඩයම් කිරීම සපුරා තහනම් වන අතර, වනජීවි සංරක්ෂණ නීතිරීති හා රෙගුලාසිවලට අනුකූලව දෙවන පාර්ශවය විසින් කටයුතු කළ යුතුය. යම්හෙයකින් එසේ වාර්තා වුයේ නම්, ගිවිසුම ඒකපාර්ශවිකව අවසන් කිරීමේ බලතල පළමු පාර්ශවය සතුවේ.

XV. ගිවිසුම්ගත කාර්යය ආරම්භ කිරීමේ සිට අවසන් කිරීම දක්වා අවශ්‍ය වන මූලික පහසුකම් සපුරා ගැනීම දෙවන පාර්ශවය විසින් සිදුකළ යුතු අතර, එම පහසුකම් සපයාදීම සඳහා පළමු පාර්ශවයට කිසිදු බැදීමක් නොමැත

**3 වන පිටුවට . . .**

**XVI.** ගිවිසුම්ගත කාර්යය ආරම්භ කිරීම සඳහා මුළු ලංසු වටිනාකමින් සියයට තිහක (30%) සවලීකරණ අත්තිකාරම් මුදලක් (Mobilization Advance) දෙවන පාර්ශවයට පළමු පාර්ශවයෙන් ඉල්ලා සිටිය හැකිය. මේ සඳහා දෙවන පාර්ශවය විසින් ලිඛිත ඉල්ලීමක් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළයුතු අතර, එම ඉල්ලා සිටින ලද මුදලට සමාන බැංකු ඇපකරයක්, මහ බැංකුවේ ලියාපදිංචි වාණිජ බැංකුවකින් ලබාගත් කොන්දේසි විරහිත, ඉල්ලූවිට ගෙවීම් සිදුකලයුතු, ආපසු හැරවිය නොහැකි ලෙස දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කර කලයුතුය. අවම වශයෙන් අත්තිකාරම් මුදලක් ඉල්ලා සිටින දිනයේ සිට දින අනූවක (90) කාලයක් සඳහා වලංගු බැංකු ඇපකරය වලංගු විය යුතුවේ.

**XVII.** ගිවිසුම්ගත කාර්යයේ (එනම් වැට ඉදිවන මාර්ගයේ කැලෑ එළිකිරීම, කපන ලද කැලෑ රොඩු පිළිස්සීම, මතුපිට පස් ඉවත් කිරීම, විදුලි වැට ඉදිකිරීම ) සියයට විසි පහක (25%) වැඩ කොටසක් නිම කල පසු (කි.මී 6.5 ක වැට නිම කළ පසු)පළමු අර්ධ ගෙවීම් මුදල (1st Part Payment) ඉල්ලුම් කිරීමට දෙවන පාර්ශවයට හැකියාව පවතින අතර, එම ඉල්ලීම ලිඛිතව පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත XI යටතේ දක්වා ඇති කමිටුවේ ලිඛිත නිර්දේශය මත සම්පූර්ණ කරන ලද සියයට විසි පහක (25%) වැඩ කොටස සඳහා ගෙවීමට නියමිත මුළු මුදලින් රඳවා ගැනීම් ලෙස සියයට දහයක් (10%) ද, සවලීකරණ අත්තිකාරම් මුදලින් (Mobilization Advance) සියයට විසි පහක් (25%) ද අඩුකර, ඉතිරි මුදල දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XVIII.** ගිවිසුම්ගත කාර්යයේ (එනම් වැට ඉදිවන මාර්ගයේ කැලෑ එළිකිරීම, කපන ලද කැලෑ රොඩු පිළිස්සීම, මතුපිට පස් ඉවත් කිරීම, විදුලි වැට ඉදිකිරීම ) සියයට පනහක (50%) වැඩ කොටසක් දක්වා නිම කළපසු (කි.මී 13ක වැඩ නිම කළ පසු)දෙවන අර්ධ ගෙවීම් මුදල (2nd Part Payment) ඉල්ලුම් කිරීමට දෙවන පාර්ශවයට හැකියාව පවතින අතර, එම ඉල්ලීම ලිඛිතව පළමු පාර්ශවය වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත XI යටතේ දක්වා ඇති කමිටුවේ ලිඛිත නිර්දේශය මත සම්පූර්ණ කරන ලද සියයට පනහක (50%) වැඩ කොටස සඳහා ගෙවීමට නියමිත මුළු මුදලින් රඳවාගැනීම සියයට දහයක් (10%) ද සවලීකරණ අත්තිකාරම් මුදලින් (Mobilization Advance) සියයට පනහක් (50%) ද අඩුකර ඉතිරි මුදල දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ. පළමු අර්ධ ගෙවීම් මුදල ද අඩුකර අදාල ගෙවීම් සිදුකරනු ලැබේ.

**XIX.** ගිවිසුම් ප්‍රකාරව කිලෝමීටර් 26 ක භූමියෙහි වැඩ නිම කිරීමෙන් පසු (කි.මී 26 ක වැඩ නිම කළ පසු)දෙවන පාර්ශවය විසින් ඒ බැව් පළමු පාර්ශවය වෙත දින පහක් (05) ඇතුලත ලිඛිතව දැනුම්දීම සිදුකළ යුතුය.

**XX.** ගිවිසුම්ගත ආකාරයට මුළු වැඩ කොටස නිමකළ පසු දින තිහක (30) කාලසීමාවක් ඇතුළත, ඉහත XI යටතේ සඳහන් කමිටුවේ ලිඛිත නිර්දේශ ලබාගෙන, අදාල තහවුරු කිරීම් සිදුකරවා ගනමින් එතෙක් අයකරවා නොගත් සවලීකරණ අත්තිකාරම් මුදල් හා අනෙකුත් අර්ධ ගෙවීම් මුදල් ද අඩුකර මුළු කොන්ත්‍රාත්තුවට අනුව ගෙවියුතු ඉතිරි වටිනාකම දෙවන පාර්ශවය වෙත ගෙවීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XXI.** යම් හෙයකින් ගිවිසුම අවලංගු වුවහොත්, දෙවන පාර්ශවය විසින් තබන ලද කාර්ය සාධන සුරක්ෂණය පළමු පාර්ශවය විසින් දෙවන පාර්ශවය වෙත නැවත ගෙවනු නොලැබේ. තවද ඉහත XVI හි සඳහන් සවලීකරණ අත්තිකාරම් මුදල වෙනුවෙන් තැබූ බැංකු ඇපකරයේ වටිනාකම හිමිකර ගැනීමට පළමු පාර්ශවය විසින් කටයුතු කරනු ලැබේ.

**XXII.** යම් හෙයකින් දෙවන පාර්ශවය විසින් කුමන හේතුවක් මත ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩ කළහොත් මෙම ගිවිසුම අවසන් කිරීමට පළමු පාර්ශවයට අයිතිවාසිකම් පවතින බවට දෙවන පාර්ශවය එකඟ වේ.

**4 වන පිටුවට . . .**

**XXIII.** යම් හෙයකින් දෙවන පාර්ශවය විසින් කුමන හේතුවක් මත හෝ ගිවිසුම කඩකරන්නේ නම්, දෙවන පාර්ශවය විසින් ඉහත XI යටතේ සඳහන් කමිටුවේ නිර්දේශ ලබාගත් භූමි කොටස්වල ගිවිසුම්ගත සම්පූර්ණ කාර්යය අවසන් කිරීමට පළමු පාර්ශවය විසින් ලබාදෙන උපරිම කාලය දින පහළොවක් (15) වන අතර, එම කාර්යය අවසන් කිරීමෙන් පසු එම කොටස් සඳහා ගෙවීම් නිදහස් කිරීමට පළමු පාර්ශවයට සලකා බැලිය හැකිය. එසේම ගිවිසුම කඩකරන අවස්ථාව වන විට ඉහත කමිටුවේ නිර්දේශ ලබානොගත් කිසිදු වැඩ කොටසක් සඳහා ගෙවීම් සිදුකරනු නොලැබේ.

**XXIV.** ඉහත සඳහන් ගිවිසුම අත්සන් කිරීමෙන් පසු දෙවන පාර්ශවය විසින් එකඟතාවය පළකර ඉදිරිපත් කර ඇති අදාල වැඩ සැලැස්මට අනුව එනම් වැට ඉදිවන මාර්ගයේ කැලෑ එළිකිරීම, කපන ලද කැලෑ රොඩු පිළිස්සීම, මතුපිට පස් ඉවත් කිරීම, විදිලි වැට ඉදිකිරීම ගිවිසුම්ගත කාර්යය නිම කර,.......................... වන දිනට හෝ ඊට පෙර අදාල භූමි කොටස දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලිඛිතව භාරදිය යුතුය. අදාල දිනය වන විට ගිවිසුම්ගත කාර්යයන් අවසන් කිරීමට දෙවන පාර්ශවය අපොහොසත් වුවහොත්, එම ප්‍රමාදවන සෑම දිනයක් සඳහාම දෙවන පාර්ශවය විසින් මුළු ලංසු වටිනාකමින් සියයට එකක (01%) ප්‍රමාද ගාස්තුවක් පළමු පාර්ශවය වෙත ගෙවිය යුතු වේ.

**XXV.** විදුලි වැට පිරිවිතරානුකූලව ඉදිකර අවසන් වූ පසු විදුලි වැට නිසි පරිදි ක්‍රියාත්මක වන බව තහවුරු කර ලිපියක් පළමු පාර්ශවය වෙත ලබා දිය යුතු වේ . මෙම තහවුරුව ලබා ගැනීමේදී ඉහත අංක XI සඳහන් කමිටුව යොදා ගත යුතු වේ. අවශ්‍ය නම් විදුලි කටයුතු පිළිබඳ තාක්ෂණික දැනුම සහිත නිලධාරි වරයකු පළමු පාර්ශවය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

**XXVI.** උපකරණ සඳහා පවතින වගකීම් කාලය තුල දෝශ සිදු වූ විටදී අදාළ උපකරණ දෝෂ නිවැරදි කිරීම මත හෝ නව උපකරණ සවිකිරිම දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයෙන් ගාස්තු අයකිරිමකින් තොරව සිදු කළ යුතු වේ.

**XXVII.** විදුලි වැට ඉදි කර අවසන් වූ පසු එහි ක්‍රියාත්මක කිරම පිළිබද හා නඩත්තුව පිළිබද පළමු පාර්ශවයෙ විසින් නම් කරන ලද සංස්ථාවේ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් පුහුණු කල යුතු වේ

**XXVIII.**

වැට ඉදිකිරීමට භාවිතකරන සියළුම උපකරණ අදාළ පිරිවිතර අනුකූල විය යුතු අතර එසේ නොවන බවට පෙනීඋ ගිය විටදී අදාළ නිවැරදි කිරීම් ගාස්තු අයකිරීමකින් තොරව දෙවන පාර්ශවය සිදු කළ යුතු වේ.

**XXIX.**

පිරිවිතර පත්‍රෙය් උපකරණ සඳහා ලබා දී ඇති වගකීම් කාලය තහවුරු කර මෙම අදාළ ලිපි ලේඛන පළමු පාර්ශවයට ඉදිරිපත් කළ යුතු වේ.

ඉහත සඳහන් කර ඇති පරිදි ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවට අයත් කොණ්ඩච්චි වතුයායේ කිලෝමීටර් 26 ක විදුලි වැට ඉදිකිරීම සඳහා (අදාළ භූමි කොටසහි වැට ඉදිවන මාර්ගයේ කැලෑ එළිකිරීම, කපන ලද කැලෑ රොඩු පිළිස්සීම, මතුපිට පස් ඉවත් කිරීම, යන විදුලි වැට ඉදිකිරීම සඳහා) වූ කොන්ත්‍රාත්තුව .......................................................................... ලිපිනයේ පිහිටි .................................................................. ආයතනය වෙත මෙයින් භාරදෙමි.

..........................................

**පළමු පාර්ශවය**

නම : ..........................................................

තනතුර : ........................................................

ලිපිනය : ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාව, තෙලවල පාර, රත්මලාන .

දිනය : 2025 ........................

කරුණු හා කොන්දේසිවලට එකඟවී, ශ්‍රී ලංකා කප්‍රු

ඉහත අංක 01 හා 02 හි I සිට XXIX දක්වා සඳහන් කරුණු හා කොන්දේසිවලට එකඟවී, ශ්‍රී ලංකා කප්‍රු සංස්ථාවට අයත් කොණ්ඩච්චි වතුයායේ කිලෝමීටර් 26 ක ( වැට ඉදිවන මාර්ගයේ කැලෑ එළිකිරීම, කපන ලද කැලෑ රොඩු පිළිස්සීම, මතුපිට පස් ඉවත් කිරීම,)විදුලි වැට ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව සාර්ථකව නිමකර දීමට මෙයින් භාරගනිමි.

..........................................

**දෙවන පාර්ශවය**

නම : ..........................................................

ජාතික හැඳුනුම්පත් අංකය : ..............................

ආයතනයේ නම : ............................................

ආයතනයේ ලිපිනය : .......................................

දිනය : 2025 ........................

**<u>සාක්ෂි :</u>**

01. අත්සන : ...................................................

නම : ....................................................

තනතුර : ...................................................

ජාතික හැඳුනුම්පත් අංකය : .......................

02. අත්සන : ....................................................

නම : ....................................................

තනතුර : ...................................................

ජාතික හැඳුනුම්පත් අංකය : .......................